

අමරපුර ශ්‍රී සම්බුද්ධ ශාසනෝදය නිකායේ අනුනායක ධූරයට අභිනවයෙන් පත් වස්කඩුවේ රාජගුරු ශ්‍රී සුභූති සහ කොටහේන දීපදුත්තාරාම යන මහා විහාරයන්හි අධිපති ශාස්ත්‍රපති වස්කඩුවේ මහින්දවංශ හිමිපාණන් වහන්සේ වෙත අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ අමරපුර නිකායාභිවෘද්ධි දයක සභාවේ සභාපති මිලින්ද මොරගොඩ මහතා විසින් අනුනායක විජිනිපත නිල වශයෙන් පූජා කළ අයුරු. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ මහානායක දවුල්දෙන ඥානිස්සර නාහිමිපාණන් ප්‍රධාන මහා සංඝරත්නය ද, කතානායක වි.ජ.මු. ලොකුබණ්ඩාර, බන්දුල ගුණවර්ධන, රාජිත සේනාරත්න, ජීවන් කුමාරතුංග යන අමාත්‍යවරු ඇතුළු විශාල පිරිසක් ද සහභාගි වූහ.